දිවි තොර කරගැනීමක් හෝ ඊට උත්සාහ ගැනීමක් මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් වාර්තා කළ යුතු බවත්, එහිදී මාධ්‍ය දැඩි ප්‍රවේසමක් අනුගමනය කළ යුතු බවත් Ethics Eye ඔස්සේ අපි නැවත නැවතත් පෙන්වා දී ඇත්තෙමු. විශේෂයෙන්ම වර්තමානයේ සමාජයේ පවතින ආතතිජනක තත්වය නිසාවෙන් ද, දිවි තොර කරගැනීම් හෝ ඊට උත්සාහ කිරීම් ආචාර ධාර්මිකව වාර්තා කිරිම මාධ්‍ය අත රැඳි සමාජ වගකීමක් වනු ඇත.

පසුගියදා (ජූනි 25, 2022) තමන් සිටි ළමා නිවාසයෙන් පලා ගිය දැරියන් දෙදෙනෙකු දිවි තොර කරගැනීමට උත්සාහ කිරීමේ සහ, ඔවුන්ව පිරිසක් එක්ව බේරාගැනීමේ සිදුවීමක් මාධ්‍ය තුළ වාර්තා වී තිබිණි. එම සිදුවීම වාර්තා කිරීමේදී දිවි තොර කරගැනීමට උත්සාහ ගත් ආකාරයද දැක්වී තිබූ නමුත්, එය පුවතට වැදගත් යැයි පැවසිය හැක.

කෙසේ නමුත්, මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී හදිසි උපකාරක අංක සඳහන් කිරීම වැදගත් වනු ඇත. ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවකින් පසු වන අයෙකුට අවශ්‍ය උපදේශනය ලබාගැනීමට පෙළඹවීමක් ලැබෙනු ඇත. එය තවත් ජීවිතයක් බේරාගැනීමක් ද වනු ඇත. එය වගකීම් සහගත මාධ්‍යකරණය යැයි ඔබ නොසිතන්නේ ද?

එසේම, මෙවැනි අවස්ථාවක වැදගත් විය හැකි ළමා හා කාන්තා කාර්යාංශය වැනි ආයතනයක දුරකථන අංක ද සඳහන් කිරීම, ප්‍රයෝජනවත් නොවනු ඇතිද?

(මෙම පුවත මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ එදින පළ වී නොතිබුණි.)

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...